**ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව - 2023**

-------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුවප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි ලේජර් ගිණුමට පිටපත් කිරීමේ දී, රු.1,599,000,000 ක මුදලක් වැඩිපුර එකතු කිරීම හේතුවෙන්, සභාවේ ඉඩම් හා ගොඩනැගිලි හා ප්‍රාග්ධනයට අදායමින් දායක වීමේ ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ආ) | ඉකුත් වර්ෂයේ දී, ස්වේච්ඡා සමිති සඳහා පුටු ලබා දීම වෙනුවෙන් ණයහිමි කළ රු.1,678,904 ක් සමාලෝචිත වර්ෂයේ කපා හැරීම සඳහා අනුමැතිය ලැබී තිබුණ ද, කපා හැර නොතිබීම හේතුවෙන්, ණයහිමියන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම මුදල රජයේ ආදායමට ගැනිමට කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |

1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත** | | | |
| | අංක 122(1) වගන්තිය | කායවර්ධන මධ්‍යස්ථානය හා ර් - නැණ පියස සඳහා රු.648,950 ක් වටිනාකමැති ගාස්තු අය කර තිබුණ ද, ඒ සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනිම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත | රු.123,625 ක් වටිනාකමැති දැන්වීම් පුවරු 33 කින් මුදල් අය කර නොතිබුණි. | දැන්වීම් පුවරු ඉවත් කිරීමට කටයුතු කරන බව | කාලීනව ගාස්තු අය කළ යුතුය |
| (ඇ) | **1988 අංක 15 දරන ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව** | | | |
| | 59 රීතිය | ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ වර්ෂය ආරම්භයේ දී කර්මාන්ත හා වෙළඳ ව්‍යාපාර බදු පිළිබඳව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | විධිමත් සැලසුමකට අනුව සමීක්ෂණ කටයුතු සිදු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය |
| (ඇ) | 2020 සැප්තැම්බර් 28 දිනැති අංක 2020/06 දිනැති මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02.2(1) ඡේදය | ස්ථාවර තැන්පතුවල ඇති මුදල් යොදවා සිදු කරනු ලබන ප්‍රාග්ධන ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, එසේ කිරීමකින් තොරව රු.20,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 04 ක් නිදහස් කර ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ගෙවීම් කර තිබුණි. | පළාත් පාලන කොමසාරිස්තුමියගේ උපදෙස් ලබා ගෙන කටයුතු කිරීමට අපේක්ෂා කරන බව | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,849,286 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.37,491,762 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2023** | | | | **2022** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,982,520 | 2,936,972 | 3,151,859 | 1,423,185 | 4,435,115 | 3,394,445 | 3,767,931 | 1,637,821 |
| (ii) | කුලී | 20,937,500 | 6,653,946 | 6,392,400 | 1,586,247 | 19,903,000 | 8,459,778 | 8,553,949 | 1,324,701 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 725,100 | 180,000 | 184,500 | 40,500 | 575,100 | 635,758 | 568,758 | 45,000 |
| (iv) | වෙනත් ආදායම් | 62,673,000 | 32,685,162 | 33,362,273 | 30,267,490 | 40,937,500 | 56,326,332 | 46,110,238 | 30,944,601 |
| | එකතුව | 90,318,120 | 42,456,080 | 43,091,032 | 33,317,422 | 66,450,715 | 69,342,213 | 59,192,476 | 33,952,123 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 05 කට වඩා වැඩි කාලයක් ඉක්ම වූ වරිපනම් ඒකක 86 කින් රු.353,723 ක හිඟ හිටි වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | දේපළහිමියන් හඳුනා ගැනීම සඳහා ගඟ ඉහළ කෝරළේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති බව | හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |
| **(ආ) අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 05 ක කාලයක් ඉක්ම වූ ඒකක 98 ක රු.80,862 ක හිඟ හිටි අක්කර බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි බදු මුදල් අය කර ගැනිමට කටයුතු කරන බව | හිඟ හා බිල් කළ ආදායම් කාලීනව අය කළ යුතුය |
| **(ඇ) කුලී** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 05 ක කාලයක් ඉක්ම වූ කඩ කාමර 17 කින් රු.1,337,962 ක හිඟ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩ කුලි අය කිරීමට කටයුතු කරන බව | හිඟ කඩ කුලී අය කළ යුතුය |
| **(ඈ) ත්‍රී රෝද රථ නවතා තැබීමේ ගාස්තු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වසර 02 කට වඩා වැඩි කාලයක සිට පැවත එන පුද්ගලයින් 97 කගෙන් ලැබිය යුතු රු.1,347,930 ක හිඟ හිටි ත්‍රී රෝද රථ ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ගාස්තු අය කිරීමට කටයුතු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය |
| **(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.794,265 ක් හා මුද්දර ගාස්තු රු.29,299,350 ක් විය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කරන බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යන ජල ව්‍යාපෘති 08 ක ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර, පාරිභෝගිකයින්ට බෙදා හරින ජලයේ තත්ත්වය හඳුනා ගෙන නොතිබුණි. එමඟින් ප්‍රාදේශීය ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉදිරියේ දී ජලය පිරිසිදු කර බෙදා හැරීමට කටයුතු කරන බව | ජල සාම්පල් පරීක්ෂා කර මහජනයාට පිරිසිදු පානීය ජලය ලබා දීමට කටයුතු කළ යුතුය |
| (ආ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් කාරණා 03 ක් වෙනුවෙන් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි | අතුර ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව | අතුරු ව්‍යවස්ථා පනවා ගත යුතුය |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කර්මාන්ත ණයගැති ගිණුමේ ශේෂය රු.3,220,178 ක් වී තිබුණු අතර, ඉන් වසර 01 ත් වසර 05 ත් අතර කාලය ඉක්මවා තිබුණු ශේෂය රු.2,680,414 ක් හා වසර 05 ක් ඉක්මවා ඇති ශේෂය රු.96,829 ක් අය කර නොතිබුණි. | ණයගැති ශේෂ නිරවුල් කරන ලෙස අදාළ ආයතනවලට ලිපි යොමු කර ඇතත්, මේ වන තෙක් එම මුදල් ලැබී නොමැති බව | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කර්මාන්ත ණයහිමි ගිණුමේ ශේෂය රු.10,884,224 ක් වී තිබුණු අතර, ඉන් වසර 01 ත් වසර 05 ත් අතර කාලයට අදාළ ශේෂය රු.4,359,198 ක් හා වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.428,169 ක් නිරවුල් කර නොතිබුණි. | ඉතිරි මුදල් ද කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය |
| (ඇ) | 2012 අගෝස්තු 03 දිනැති අංක 1770 දරන ගැසට් පත්‍රයේ වැඩි දියුණු කළ ප්‍රදේශ වශයෙන් නව ප්‍රදේශ 05 ක් නම් කර ඇතත්, සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් වසර 11 ක් ගත වී තිබුණ ද, දේපළ හඳුනා ගැනීමේ කටයුතු සිදු කර දේපළ තක්සේරු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවට තක්සේරු කිරීම සඳහා වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව | දේපළ හඳුනා ගෙන වරිපනම් ප්‍රදේශ නම් කර, බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගම්පොල නගර සභාව විසින් වරිපනම් ඒකක 135 කින් වරිපනම් බදු අය කරනු ලැබූ වීගුලවත්ත ප්‍රදේශය 2018 වර්ෂයේ සීමා නිර්ණයෙන් පසුව ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවට අයත් වුව ද, එම ප්‍රදේශයේ පිහිටි දේපළ තක්සේරු කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. | බදු අය කිරීමේ හැකියාව පිළිබඳව විමසීමට ලිපි යොමු කර ඇති බව | තක්සේරු කර බදු අය කළ යුතුය |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමර්සෙඩ් කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉකුත් වර්ෂයේ මාර්තු 25 දින කාර්යය අවසන් කර මෙම මධ්‍යස්ථානයට විවිධ ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබුණු ඇඳන් හා උපාංග 297, ප්ලාස්ටික් පුටු 301, ලී ස්ටූල් 23, රූපවාහිනී හා උපාංග 04, රෙදි සෝදන යන්ත්‍ර 03, කෑම මේස 08, ජෙනරේටරයක්, විදුලි පංකා 63, CCTV කැමරා 16, වතුර මෝටර් 07, ප්ලාස්ටික් වතුර ටැංකි 07 ක්, වතුර පිල්ටර් 07 හා ශීතකරණයක් ඇතුළු උපකරණ ඉකුත් වර්ෂයේ මාර්තු 25 දින ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය ලේකම් විසින් ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ, සභාපති වෙත ලිඛිතව භාර දී තිබුණි. මෙම උපකරණවලින් විදුලි පංකා 10 ක් ඇඳන් හා උපාංග 12 ක් හා රෙදි සෝදන යන්ත්‍රයක් පමණක් නිකුත් කළ බවට සනාථ කිරීම් ඉදිරිපත් කර තිබුණු අතර, අනෙකුත් භාණ්ඩ නිකුත් කිරීමේ තොරතුරු ඉදිරිපත් නොවූ බැවින්, මේ සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු අය තීරණය කර අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සියලු භාණ්ඩ ලේඛනගත කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සිදු කර ඇත. සභාව මඟින් ලබා දුන් භාණ්ඩ නැවත ලබා ගැනීමට කටයුතු කර ඇත. අනෙකුත් භාණ්ඩ ගරු ඇමතිතුමාගේ උපදෙස් පරිදි විහාරස්ථාන හා ආයතන වෙත ලබා දීමේ අරමුණින් මහින්දානන්ද පදනමට ලබා දී ඇති බව | අවශ්‍යතාවය හඳුනා ගෙන විධිමත් ක්‍රමවේදයකින් අවශ්‍ය ලේඛන සහ ලිපිගොනු පවත්වා ගෙන බැහැර කළ යුතු අතර, අවිධිමත් නිකුත් කිරීම් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(xi) වගන්තිය ප්‍රකාරව විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන, සභාවට අයත් ඇත්ගාල ක්‍රීඩාපිටිය අසළ පිහිටි දෙමහල් ගොඩනැගිල්ල ඇත්ගාල පොලිස් ස්ථානයට 2021 නොවැම්බර් 01 දින සිට ලබා දී තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන තෙක් ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. 2021 නොවැම්බර් 01 දින සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා පොලිස් ස්ථානය වෙත ලබා දුන් දෙමහල් ගොඩනැගිල්ලට ලබා ගත් තක්සේරුව අනුව, රු.910,000 ක බදු මුදලක් අය කර නොතිබුණි. | ඉඩම පවරා ගැනීමෙන් පසු ගිවිසුම් ගත වීමටත් හිඟ බදු මුදල් අය කිරීමට කටයුතු කරන බව | ගිවිසුම්ගත වී බදු මුදල් අය කර ගත යුතුය |

### 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (මූල්‍ය හා පරිපාලන) 128 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් පොදු කටයුතු සඳහා භාවිතා කරනු ලබන ඉඩම් කැබලි 30 ක් අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව | සභාව සතු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගත යුතුය |
| (ආ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් අක්කර 01 රූඩ් 03 පර්චස් 05.26 ක් වූ කුරුඳුවත්ත පිහිටි ඉඩම සභාව වෙත පවරා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 28 වන දින රු.9,993,090 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත ගෙවා තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. සභාව විසින් 1997 වසරේ සිට 2010 වසර දක්වා කාලය තුළ මෙම ඉඩම පරිහරණය කිරීම වෙනුවෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට රු.87,360 ක පරිහරණ ගාස්තුවක් ද ගෙවා තිබුණි. | ඔප්පුව කඩිනමින් ලබා ගැනිම සඳහා කටයුතු කරන බව | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

### 3.5 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිලි 02 ක් ඉදිකිරීම සඳහා රු.11,284,645 ක මුදලක් වැයකර තිබුණ ද, අර්ධ වශයෙන් ඉදිකර ඇති බැවින්, අපේක්ෂිත නිමවුම් මට්ටම (output) අත්පත් කරගෙන නොතිබුණි. | මෙම වැඩ අවසන් කර අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා ගැනීමට අපේක්ෂා කරන බව | ව්‍යාපෘතිය නිම කර මහජන අවශ්‍යතා ඉටු කළ යුතුය |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් ව්‍යාපෘතිවල හැඩයම් ලෑලි (Form Work) සඳහා මාර්ග සම්මත අනුපාතය (HSR) අනුව ST 57 රේටයන් යොදා නොගෙන ST 64 රේටය ඇස්තමේන්තු කිරීම හේතුවෙන් ව්‍යාපෘති 13 කට රු.170,528 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ST 64 යොදා ගැනීමට කටයුතු කළේ නිසි පරිදි කාර්යය නිම කිරීම සඳහා බව | අදාළ රේට මත ඇස්තමේන්තු නොකළ නිලධාරීන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ආ) | 2023 වර්ෂයේ ලංකා විදුලි බල මණ්ඩලයේ ප්‍රතිපාදන මත උලපනේ මල්වත්ත ජයතිස්ස මහතාගේ නිවස අසළ ආරක්ෂක බැම්ම ඉදිකිරීම - රු.8,199,561 | | |
| i. | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති VIII අධිකාරය 03 ඡේදය ප්‍රකාරව, ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව රු.8,442,935 ක ඇස්තමේන්තු මුළු වටිනාකම රු.2,000,000 බැගින් ව්‍යාපෘති ඇස්තමේන්තු 04 ක් පිළියෙල කර වෙන වෙනම ග්‍රාම සංවර්ධන සමිතියකට ඉදිකිරීම් පවරා තිබුණි. | අරමුදල් කොටස් වශයෙන් ලබා දීම හා හදිසි අවශ්‍යතාවයක් වූ බැවින්, ග්‍රාම සංවර්ධන සමිතිය සමඟ ගිවිසුම්ගතව ඉටු කළ බව | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| ii. | ව්‍යාපෘතියේ දෙවන අදියරේ උස මීටර් 4.5 බැම්මේ ඉදිකිරීම් 2023 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂයේ ඉටු කළ ද, 2023 මුල් අර්ධ වර්ෂයේ රේට භාවිතා කිරීම හේතුවෙන් වැඩ විෂයය අංක 04, අංක 05 හා අංක 06 සඳහා රු.271,553 ක් වැඩිපුර ගෙවා තිබුණි. වැඩ විෂයය අංක 09 අනුව, කි.මී.120 ක දුර සිට වැලි ප්‍රවාහනය සඳහා 2023 දෙවන අර්ධ වර්ෂයේ රු.7,262 ක මිල අනුපාත (HSR) භාවිතා කළ යුතු වුවත්, 2023 මුල් අර්ධ වර්ෂයේ රු.8,698 ක මිල අනුපාත භාවිතා කර, ඝන මීටර් 37.60 කට රු.1,430 ක් බැගින් රු.53,768 ක් ද, වැර ගැන්වීම් (Reinforcement) සඳහා රු.678 ක මිල වෙනුවට රු.776 ක මිල භාවිතා කිරීම හේතුවෙන්, කි.ග්‍රෑ.858.1 කට රු.98 ක් බැගින් රු.84,094 ක් ද වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ඇස්තමේන්තුව පිළිගනු ලැබූ හෙයින් ඒ අනුව කාර්යය නිම කිරීමට කටයුතු කළ බව | නිවැරදි මාර්ග සම්මත මිල ගණන් (HSR) අනුව ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතුය |
| iii. | වැඩ විෂයය අංක 07 හැඩයම් ලෑලි (Form Work) සඳහා මාර්ග සම්මත අනුපාතය (HSR) ST 065 (General Purposes) රේටය භාවිතා කළ යුතු වුවත්, ST 061 පාලම් සඳහා වන රේටය භාවිතා කිරීම හේතුවෙන් උස මීටර් 4.5 හා 3.00 යන ආරක්ෂක බැම් 02 ක සඳහා රු.329,672 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | උස බැම්මක් බැවින්, පාලම් ආධාරක බැම් සඳහා ST 61 රේටය යොදා ගත් බව | |
| (ඇ) | මල්වත්ත වසමේ කුරුඳුවත්ත ආපදා ගම්මානයේ ජල ව්‍යාපෘතියේ 02 අදියර ඉටු කිරීම - රු.1,611,565 | | |
| | මෙම ව්‍යාපෘතියේ වැඩ විෂයය අංක 02 අනුව, මි.මී.40 බට යෙදීමේ දී 2023 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂයේ වාරි සම්මත රේටය (WSR) P:8 රු.1,658 රේටය භාවිතා කළ යුතු වුවත්, 2023 වර්ෂයේ පළමු අර්ධ වර්ෂයේ වාරි සම්මත රේටය WSR P:8 රු.2,248 ක් භාවිතා කිරීම හේතුවෙන්, මීටර් 659.86 කට රු.590 ක් බැගින් රු.388,752 ක් වැඩිපුර ගෙවා තිබුණි. | සංශෝධිත WSR නොලැබීම හා මහජන ඉල්ලීම මත පැවති WSR භාවිතා කර විනිවිදභාවයකින් ක්‍රියාත්මක කළ බව | නිවැරදි ජල සම්මත මිල ගණන් (WSR) අනුගමනය නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කළ යුතුය |
| (ඈ) | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - රු.74,612,900 | | |
| i. | මෙම ව්‍යාපෘතිය සඳහා ඉටු නොකළ මූලික වියදම් (Pilimeneries) සඳහා රු.708,750 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් අඛණ්ඩව සිදු කර ගෙන යන ලද අවස්ථාවේදි පැවති සැපයුම් තත්වයන් සලකා බලමින් මූලික වියදම් අයිතම සඳහා ප්‍රතිශතාත්මකව අදාල මුදල් ගෙවීමට නිර්දේශ කර ඇති බව | මූලික වියදම් යටතේ අවශ්‍යතා හා පහසුකම් සැපයීමට අදාළව පමණක් ගෙවීම් කළ යුතුය |
| ii. | අමතර වැඩ විෂයය අංක 31 යටතේ ගල් කැඩීම සඳහා විශේෂ මිල විශ්ලේෂණයකින් ගල් ඝන මීටර් 47.80 ක් කැඩීමට රු.13,544 ක් බැගින් රු.647,403 ක මුදලක් ගෙවා තිබුණ ද, කඩා ඉවත් කළ කළු ගල් මිණුම්ගත | මෙම ගල කුට්ටි වශයෙන් කඩා ගැනිමට නොහැකි වූ අතර, කුඩා කුඩා කොටස් වශයෙන් කැඩී යන ලදි. එබැවින් පිහිටි | කඩන ලද ගල් ගොනු කර මිනුම් ගෙන අදාළ ලොග් |

| | | | |
|---|---|---|---|
| | කර හෝ ක්ෂේත්‍රය තුළ ගොනු කර හෝ නොතිබිය දී, ගල් කැඩීම වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. | ගල විශාල වුවත් , ගල කැඩී යන ලද්දේ කුඩා කොටස් වශයෙන් බැවින් ඒවා නැවත ප්‍රයෝජනයට ගත හැකි මට්ටමේ ගල් නොවිය. එබැවින්, ලේඛනගත කර භාර දීමට ප්‍රමාණවත් වටිනාකමක් නොවූ බැවින්, සුන්බුන් ආකාරයට වැඩ බිම තුල ගොඩ ගසා තිබුණු බව | සටහන්වල දැක්විය යුතුය |
| iii. | අමතර වැඩ විෂයය අංක 32 යටතේ පාදම සඳහා කපපු සියලු පස් ඝන මීටර් 1,370 ක් ඝන මීටරයකට රු.402 බැගින් ප්‍රවාහනය සඳහා රු.550,740 ක මුදලක් ගෙවා තිබුණි. ඒසේ වුවත්, කපපු පස් ව්‍යාපෘති වැඩ බිමේම දමා තිබීමෙන් ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් කළ බව නිරීක්ෂණය විය. | ගෙපොල කැපිමේදි එක් රොක් වු පස් වැඩබිමෙන් ඉවත් කොට ප්‍රවාහනය කිරිම සඳහා වූ ගාස්තු ගෙවිමට නිර්දේශ කරන ලද අතර, පාදම ඉදි කිරිමේදි කපන ලද පස් පමණක් නැවත පාදම පුරවන තෙක් වැඩ බිමේ ගොඩ ගසා තිබුණු බව | ඉටු කරන ලද වැඩ පිළිබඳව ලොග් සටහන් තබා නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කළ යුතුය |